පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119 (4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලාව අංක 290
ආයතනයේ නම :- වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය

	කමිටුව විසින් හඳුනාගත් දුර්වලතා	දුර්වලතා මඟ හරවා ගැනීම සඳහා ගත් ක්‍රියාමාර්ග/වර්තමාන තත්වය
01	මු.රෙ. 94(1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව අනුමත සීමාව ඉක්මවා බැඳීම් ඇතිකර ගෙන තිබුණි.	ප්‍රතිපාදන නොමැතිවීම කොන්ත්‍රාත්කරුවන් සමඟ සේවා සපයන බාහිර පාර්ශවයන් සමඟ එම බැරකම්වලට එළඹී නොමැත. මු.රේ. 94 (1) ප්‍රකාරව කටයුතු කරනු ලැබේ.
02	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතීම.	2022.12.31 දින වන විටත් අයකර ගැනීමට නොහැකිව තිබූ ස්ථානමාරුවී ගිය දිනය නිශ්චිතව සඳහන් නොවන නිළධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.119,200.00 ක් වූ ණය ශේෂ 1990 දශකය තරම් පැරණිය. එම ණය ශේෂ කපා හැරීමට රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් කරන ලද අතර එහි නිර්දේශයන් අනුව ණය ශේෂය කපා හැරීමට කමිටුවක් පත්කර කරුණු අධ්‍යනය කර කමිටු වාර්තාව 2019.10.18 දින ඉදිරිපත් කරන ලදී. එම ණය ශේෂ දෙක පිලිබඳ කිසිදු තොරතුරක් නොමැති බැවින් නීති උපදෙස්, මරණ සහතික, ඇපකරුවන්ගේ ප්‍රකාශන ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත. එබැවින් එම ණය ශේෂ දෙක කපාහැරීමට උපදෙස් ලබා දෙන ලෙස 2023.11.01 දිනැතිව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට ලිපියක් යොමුකරන ලදී. වැඩ තහනමකට ලක්වී ඇති ජේ.ඒ.ආරියසේන මහතාගෙන් අයවීමට නියමිත රු: 293,470.00 ක ණය ශේෂය, ඒ මහතාට විරුද්ධව අල්ලස් හා දූෂණ විමර්ශන කොමිෂන් සභාව විසින් මහාධිකරණයේ පවරා ඇති නඩුවේ තීන්දුව මත එම නිලධාරියා අභියාචනාධිකරණයේ ගොනුකර ඇති නඩුව 2022.03.08 දින විභාගයට ගත් අතර එහි තීන්දුවෙන් ඔහු වැරදිකරු ලෙස ප්‍රකාශයට පත් කර ඇත. ඔහුට ණය ශේෂය ගෙවන ලෙස

K.D.S. Ruwanchandra
Secretary
Ministry of Ports, Shipping & Aviation
No. 19, Chaithya Road, Colombo 01, Sri Lanka.

		2022.08.26 සහ 2022.11.29 යන දිනවල දන්වා ඇත. ඔහුගේ කලත්‍රයාගේ විශ්‍රාම වැටුපෙන් අයකර ගැනීමට අනුමැතිය ලබාදෙන ලෙස හා ඒ සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස දන්වා 2023.07.18 දිනැතිව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ලිපියක් යොමුකරන ලදී.
03	සැලසුම්සහගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	2021 වර්ෂයේ පැවති කොවිඩ් 19 වෛරසයේ අවදානම හේතුවෙන් බොහෝමයක් පුහුණු පාඨමාලාවන් එම පාඨමාලා පවත්වනු ලබන ආයතන මඟින් කල්දැමීම නිසා සහ මාර්ගගත (Online) ක්‍රමයට පැවැත්වීම හේතුවෙන් අපේක්ෂිත වූ පරිදි නිලධාරීන් පුහුණු පාඨමාලා සඳහා සහභාගී කරවීමට නොහැකි විය. එබැවින්, 2021 වර්ෂය සඳහා සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී ඇති පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතිණි. නමුත් 2022 වර්ෂයේදී 67% සහ 2023 වර්ෂයේදී 75% ක ප්‍රතිශත මට්ටමක් ළඟා කර ගෙන ඇත. ඉදිරි වර්ෂයේදී (2024) 75% ක මට්ටම වඩා ඉහළ ප්‍රතිශතයක් ළඟා කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීමට අපේක්ෂා කරන බව කාරුණිකව දන්වා සිටිමි.

K.D.S. Ruwanchandra
Secretary
Ministry of Ports, Shipping & Aviation
No. 19, Chaithya Road, Colombo 01, Sri Lanka.